ජාතික අයවැය චක්‍රලේඛ අංක : 126

මගේ අංකය :- බීඩීජ්/965/1/430
ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

2005 දෙසැම්බර් 30

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්, හා
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත.

**2006 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවල අන්තර්ගත අමාත්‍යාංශවල විෂයයන් හා කාර්යයන් අංක 1422/22 දරණ ගැසට් පත්‍රයට අනුව <u>සංශෝධනය කිරීම සහ ගිණුම්කරණය පිළිබඳ කාර්ය පටිපාටි</u>**

අතිගරු ජනාධිපති තුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති 2005.12.08 දිනැති අංක 1422/22 දරණ අති විශේෂ ගැසට් නිවේදනයෙන් අමාත්‍යාංශ සඳහා වෙන් කර දී ඇති විෂයයන් හා කාර්යයන්, 2006 වර්ෂය සඳහා සකස් කර ඇති අයවැය ඇස්තමේන්තුවල ඇතුලත් වන සමහර අමාත්‍යාංශවල විෂයයන් හා කාර්යයන්ට වඩා වෙනස් වූ අවස්ථා කිහිපයක් ඇත. එකී ගැසට් නිවේදනයට අනුව එම අමාත්‍යාංශවලට අදාළ නොවන විෂයයන් සඳහා මූල්‍යමය ප්‍රතිපාදන සලසා ඇති වැය විෂය විස්තර මේ සමග අමුණා ඇති උපලේඛනයේ දැක්වෙන අතර, එම ප්‍රතිපාදන අදාළ අමාත්‍යාංශ වෙත ලබා දෙන ආකාරය පහත දක්වා ඇත.

(අ) එක් එක් අමාත්‍යාංශයට අදාළ නොවන විෂයයන්ට/කාර්යයන්ට වෙන් කර දී ඇති ප්‍රතිපාදන දැක්වෙන වැය ශීර්ෂ විස්තර උපලේඛනයේ 3 වන තීරුවේ දැක්වේ.

(ආ) මු.රෙ. 208 අනුකූලව, මෙම ප්‍රතිපාදන 4 වන තීරුවේ නම් සඳහන් අමාත්‍යාංශවලට ලබා දිය යුතු වේ. මෙලෙස ලබා දෙන ප්‍රතිපාදන සම්බන්ධයෙන් අංක 228 හා 449 දරණ මුදල් රෙගුලාසි යටතේ දැක්වෙන ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතු වේ.

1. ගිණුම්කරණ කාර්ය පටිපාටිය

මෙම වැය ශීර්ෂවල වියදම් ගිණුම්ගත කළ යුත්තේ 3 වන තීරුවෙන් දක්වා ඇති වැය ශීර්ෂවලටමය.

2. පොදු

2005.12.08 දිනැති අංක 1422/22 දරණ ගැසට් නිවේදනයට අනුව යම් අමාත්‍යාංශයකට අදාළ නොවන යම් ව්‍යාපෘතික් හෝ කාර්යයක්, අමුණා ඇති උපලේඛනයට යම් හෙයකින් ඇතුලත් කර නොමැති නම්, එවැනි ව්‍යාපෘති සහ කාර්යයන් සඳහා වන අයවැය ප්‍රතිපාදන, මා වෙතද දන්වමින් මු.රෙ. 208 යටතේ අදාළ අමාත්‍යාංශය වෙත අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් ලබා දිය යුතු වේ.

3. පැහැදිලි කිරීම්

ඔබට කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ව්‍යවස්ථාපිත මණ්ඩලය පිළිබඳව කටයුතු කරන අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් විමසා කටයුතු කළ හැකිය.

එස්. බී. දිවාරත්න
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්